ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

පුවත්පත් නිවේදනය

***

**ඉන්දියානු මහ කොමසාරිස්තුමා** ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් **පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පර්යේෂණ සමුළුව අමතයි**

**මහ කොමසාරිස්තුමා අස්ගිරි-මල්වතු මහ නායක හිමිවරුන්ද බැහැ දකී**

ඉන්දීය මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මැතිතුමා පේරාදෙණිය විශ්ව විද් යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික පර්යේෂණ සමුළුව වන RESCON 2019 හි සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අද දින සහභාගී විය. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උප කුලපති මහාචාර්ය පරාක්‍රම කරුණාරත්න මැතිතුමා ගරු ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ අතර නිව්යෝක් හි සිටි යුනිවර්සිටි (City University) හි මහාචාර්ය ඇලන්ස් ලියොන්ස් මහතා ප්‍රධාන දේශනය පැවැත්වීය. පර්යේෂකයන් 200කට අධික සංඛ්‍යාවක් සහ විශ්ව විද්‍යාල සාමාජිකයන් විශාල පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ. තම දේශනය පවත්වමින්, මහ කොමසාරිස්තුමා ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ පොහොසත් විද්‍යාත්මක සංස්කෘතිය පිළිබඳව සිහිපත් කළේය. ඉන්දියාව මෑත කාලය තුළ විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රය තුළ ලබා ඇති ජයග්‍රහණ පිළිබඳවද සඳහන් කළ මහ කොමසාරිස්තුමා ශ්‍රී ලාංකිය විද්වතුන්ට ඉන්දීය විද්වතුන් සමඟ විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රය තුළ සහයෝගයෙන් වැඩ කිරීමට ඇති අවස්ථාවන් පෙන්වා දුන්නේය. ඉන්දියාව අඛණ්ඩවම ශ්‍රී ලංකාව සමඟ සිටි බව අවධාරණය කළ මහ කොමසාරිස්තුමා 2019 ජූනි මාසයේදී ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ශ්‍රී ලංකාවේ සිදුකළ

සුහද සංචාරයෙන් අනතුරුව ශ්‍රී ලංකාවට පැමිණෙන ඉන්දීය සංචාරකයින් සංඛ්‍යාව ශ්‍රී ලංකාවට දෙවනුවට වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් පැමිණෙන රටෙන් වාර්තා වන සංචාරකයන් ගණන මෙන් තෙගුණයක් පමණ වන බව ප්‍රකාශ කළේය. මෙම අවස්ථාව ඇමතූ උප කුලපතිතුමා පේරාදෙණිය විශ්ව විද්‍යාලය ඉන්දියාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම අගය කළ අතර විශ්ව විද්‍යාලය ඉන්දීය තාක්ෂණ සහ ආර්ථික සහයෝගීතා (ITEC) වැඩසටහන සඳහාද සහභාගී වන බව සඳහන් කළේය.

2 ර්යේ පස්වරුවේදී මහ කොමසාරිස් සන්ධු මැතිතුමා අස්ගිරි සහ මල්වතු මහ නාහිමිවරුන් බැහැ දැක ආශිර්වාද ලබා ගත්තේය. එතුමා ශ්‍රී දළදා මාළිගාවද වැඳ පුදා ගත්තේය.

කොළඹ

2019 ඔක්තෝබර් 11